අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 1995/01

මගේ අංකය : 3/පාසං/ප්‍රාඅ11
ජාතික පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන අංශය,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1995 ජනවාරි 02 දින.

සියලුම,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ය,

## තුන්වන වසර නව විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම - 1995

01 ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සකස් කරනු ලැබ එම ආයතනයේ පාලන සභාව විසින් පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කොට ඇති 3 වසර නව විෂය නිර්දේශය 1995 ජනවාරි මස සිට දිවයිනේ සියලු ම සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල ක්‍රියාත්මක කළ යුතු වේ.

02 ඒ සඳහා කරුණාකර පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ ක්ෂණික අවධානය යොමු කරන්න.

I ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු කරන ලද ගුරු උපදේශකවරුන් සහාය කර ගනිමින් නව විෂය නිර්දේශ භාවිතය පිළිබඳ 3 වසර ගුරුවරුන් දැනුවත් කිරීම.

II ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්, ඔබ පළාතේ සම්බන්ධීකාරක නිලධාරීන් වෙත සපයනු ලබන විෂය නිර්දේශයේ මුද්‍රිත පිටපත් පාසල් අතර බෙදා දීම.

III තුන්වන වසර පන්තිවල අධ්‍යයන - අධ්‍යාපන ක්‍රියාවලියේදී ඒ ඒ විෂය ක්ෂේත්‍රය හා කාර්යයන් වෙනුවෙන් සතියකට වෙන් කළ යුතු කාලය පිළිබඳ යෝජනා විදුහල්පතිවරුන්ට දැනුම් දීම.

IV ඉංග්‍රීසි විෂය හැර අනෙක් සියලු විෂයයන් සඳහා එක් ගුරුවරයකු යොදා ගැනීමටත්,
අවශ්‍ය අවස්ථාවන්හිදී සම්පත් පුද්ගල සහාය ලබාගැනීමටත්,
සහජීවන පුරුදු කෙරෙහි නිරන්තර ව සැලකිලිමත් වීමටත්,
ප්‍රාථමික පංතිවල ඉගැන්වීමේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ පියවර ගැනීමටත්,
විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට උපදෙස් දීම.

03 3 වසර සඳහා කාලය බෙදා ගත යුතු අයුරු පහත දක්වේ.

| විෂය ක්ෂේත්‍රය | සතියකට කාලය | |
|---|---|---|
| | පැය | මිනිත්තු |
| 1 ආගමික වතාවත් හා උදය රැස්වීම. (දිනකට මිනිත්තු 15 බැගින්) | 1 | 15 |
| 2 ශාරීරික අධ්‍යාපනය (රැස්වීමෙන් පසුව දිනකට මිනිත්තු 15 බැගින්) | 1 | 15 |

| | | |
|---|---|---|
| 3 විවේකය (දිනකට මිනිත්තු 20 බැගින්) | 1 | 40 |
| 4 ආගම ඉගෙනීම | 1 | 45 |
| 5 භාෂා වර්ධනය (මව් බස) | 4 | 40 |
| 6 ගණිත ක්‍රියාකාරකම් | 4 | 40 |
| 7 ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම | 2 | 55 |
| 8 අප හා පරිසරය ආශ්‍රිත ඉගෙනුම් ක්‍රියාකාරකම් | 3 | 20 |
| 9 නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 1 | 45 |
| 10 සෞන්දර්ය අධ්‍යාපනය | 1 | 45 |
| මුළු කාලය | 25 | 00 |

04 මේ විෂය නිර්දේශ සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහාත්, ප්‍රාථමික අධ්‍යාපනයේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහාත් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අයගකොට සලකමි.

කමලා වික්‍රමසිංහ
අතිරේක ලේකම් (සාමාන්‍ය අධ්‍යාපන)
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

අ. කළේ / එම්. ඩී. ඩී. පීරිස්
ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

රෝ/95. 01. 03